# සෙඛියාවන්ගෙ සදාචාරාත්මක අගය

ගරු කලම්පිටියේ සුමංගල හිමි

"සික්ඛිතබ්බාති සික්ඛා"යි දැක්වූ පරිදි හික්මියයුතු බැවින් ශික්ෂා නමැයි ගත්කල බුදුරජාණන් වහන්සේ විසින් පණවන ලද ශික්ෂාපද හැම එකක්ම සෙඛියා ගණයෙහිලා ඇතුළත්කළහැකි නමුදු මෙහිදී 'සෙඛියා' යන්නෙන් ප්‍රාතිමෝක්ෂයෙහි සෙඛියා නමින් ගැනෙන පන්සැත්තෑවක් පමණ වූ ශික්ෂාපද ම අදහස් කළබව පළමු කොට ම සඳහන් කළයුතුව ඇත.

අපැහැදුනවුන්ගේ පැහැදීමටත් පැහැදුනවුන්ගේ එම පැහැදීම වැඩිවීමටත්, සංවර ශීලී භික්ෂුසමාජයක් ඇතිවීමටත් ඉවහල් වන්නාවූ ශික්ෂාපද සමූහයක් වශයෙන් පමණක් නොව සදාචාර සංවර්ධනයෙහිලා උපයෝගී වන වැදගත් ආචාරධර්ම පද්ධතියක් වශයෙන් ද සෙඛියාවන්ට ලැබෙන්නේ අති විශිෂ්ඨස්ථානයකි. ලොව පහළ වූ ශාස්තෘවරුන්, දේශකයන්, දර්ශනිකයන් හා ආගමික නායකයන් අතර සදාචාරය අතිශයින් අගය කළ ශාස්තෘවරයෙකු වශයෙන් බුදුරජාණන් වහන්සේටත් ලොව පහළ වූ දේශනාවන්, දෘෂ්ටිවාද, ආගමික ඉගැන්වීම් හා දර්ශනයන් අතර සදාචාරය අතිශයින් අගයකළ දහමක් වශයෙන් බුදු දහමටත් අද්විතීයස්ථානයක් ම හිමිවන බව අවිවාදයෙන් පිළිගතයුතු කරුණක් බවද මෙහිදී පැවසිය යුතුය.

සෙඛියාශික්ෂාපදවිශේෂයෙන් භික්ෂූන් වහන්සේලා සඳහා පණවන ලද ඒවා බව අපි දනිමු. එද බුද්ධකාලීන භික්ෂුසමාජයේ වැඩසිටි භික්ෂූන් වහන්සේලා උදෙසා දේශනා කරන ලද, පණවන ලද ශික්ෂාපද වුවද ඒවා කවදටත්, කාටත්, ඕනෑම ශිෂ්ට සම්පන්න සමාජයකටත් ගැළපෙන ඒවා වන අතර තත්කාලීන භාරතීය භික්ෂූන් වහන්සේලාට පණවා වදළත් කවර කලෙක වුවද ජීවත්වන භික්ෂූන් වහන්සේලාටත් ගැළපෙන – සැසඳෙන – සරිලන, ශිෂ්ටසම්පන්න ආචාර සමාචාරයන්ගෙන් පිරිපුන් සමාජයක් බිහිකරලීමට සමත්වන, ඉගැන්වීම් බව ප්‍රකාශ කළ හැකිය.

ශීලාචාර සමාජයක මිනිසුන් කන බොන, අඳින, පළඳින, හැසිරෙන විට නොකළ යුතුයයි සම්මත සියලු සිරිත් බුදුරජාණන් වහන්සේ මෙයට අවුරුදු දහස් ගණනකට ප්‍රථමයෙන් ස්වකීය ශ්‍රාවක සංඝයාට දේශනාකර ඇතිබව සෙඛියා පිළිබඳව විමසීමේදී මොනාවට පැහැදිලි වන අතර ලෝකයේ ඉපැරණි ශිෂ්ටසම්පන්න සිරිත් විරිත් දේශනාකර ඇත්තේ බුදුරජාණන් වහන්සේ විසින් බවද මේ අනුව කිවහැකිව කිවයුතුව තිබේ.

සෙඛියා ශික්ෂාපද පැනවීමෙහි ලා පසුබිම් වූ බුද්ධකාලීන භාරතීය සමාජයේ පැවැති ඇතැම් අශීලාචාර ගතිපැවතුම් හා සිරිත් පිළිබඳවත් අද පවා එහි වාසය කරන අත් ලෙවකමින් කොලු ලෙවකමින් තලු ගසමින් අශීලාචාර අන්දමින්, අශිෂ්ට ලෙස හැසිරෙතැයි කියන ඇතැම් පුද්ගලයන් පිළිබඳවත් වර්තමාන සමාජයේ ජීවත්වන සංකීර්ණවූත්, විෂමවූත්, අශිෂ්ට හා අශීලාචාරවූත් යාම ඊම, කෑම බීම, ඉඳුම් හිටුම්, කථා බහ ඇති පුද්ගලයන් බොහෝ දෙනෙකු ගැන සලකාබැලීමේදීත් සෙඛියා ධර්මයන්හි එන ඉගැන්වීම්වල අගය වටිනා

කම හා එබඳු ආචාරධර්ම පද්ධතියක ආවශ්‍යකත්වය බෙහෙවින් වැඩිවන බව මැනැවින් පැහැදිලි වෙයි.

ප්‍රාතිමෝක්ෂයේ දී පරිමණ්ඩල - උජ්ඣග්ගික - ඛම්භකත - සක්කච්ච කබල සුරුසුරු - පාදුක යනුවෙන් වර්ගකීපයකට බෙදු ඇති සෙඛියාධර්ම හැත්තෑපහත් "අඤ්ඤො මෙ ආකප්පො කරණීයොති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං"යි දසධර්ම සූත්‍රයේ දී වදාළ පරිදි අන්‍ය වූ ආකල්පයකින් යුක්තව විසියුතු වූ භික්ෂූන් වහන්සේ නමක් විසින් ශිෂ්ටසම්පන්න ලෙසත් සදාචාරසම්පන්න ලෙසත්, ශීලාචාර ලෙසත් එමෙන් ම තමාගෙන් අනුන්ට කිසිම අයුරකින් කරදරයක් නොසිදුවන ලෙසත් සිවුරුපිළි හැඳියයුතු, පෙරවිය යුතු, සිනාසිය යුතු, ගමන්කළ යුතු, හැසිරිය යුතු, වැළඳිය යුතු, මළමූත්‍රකළ යුතු, කෙළගැසිය යුතු අන්දම මෙසේ වියයුතුය යි මනාකොට දක්වා ඇත.

යම් පුද්ගලයෙකුගේ ශිෂ්ට අශිෂ්ට බව තේරුම් ගන්නට ඔහුගේ සාමාන්‍ය දෛනික ඇවතුම් පැවතුම් බොහෝ සෙයින් උපකාරි වෙයි. ඔහුගේ ක්‍රියා කලාපය ග් අනුව ඔහු තුළ පවතින යම් යම් චරිත ලක්ෂණ මනාව තේරුම්ගන්නට ඔහුගැන විමසිලිමත් වන ඕනෑම කෙනෙකුට හැකියාවක් ලැබේ.

"ආකාරෛරිඞ්ගිතෛගීත්‍යා
වෙෂ්චයා භාෂනෙනච
නෙත්‍ර වක්ත්‍ර විකාරෛශ්ච
ලක්ෂ්‍යතෙන්තර්ගතඃ මනඃ"

යන පඤ්චතන්ත්‍රයේ(45) එන සකු සිලොවින් කියැවෙන අදහස් පිරික්සා බැලීමේ දී වුව ද මේ කරුණ පැහැදිලි කරගත හැකිය. යමෙකුගේ බාහිර හැසිරීම් වලින්, එනම් යමෙක් කනබොන හැටියෙන් අඳින පළඳින හැටියෙන් යන එන හැටියෙන් කතාබහෙන් ඔහුගේ අහංකාරයේ, තමන්ගේ කෑදරකම, අසංවරය මානය, අහංකාරය, අසභනශිලී ස්වභාවය ප්‍රකට වේනම් එය එතරම් සුදුසු නැත. ඔහුගේ එම බාහිර ලක්ෂණ වලින් හෙළි වන්නේ තම ආභ්‍යන්තරික වූ චිත්තයාගේ ස්වභාවයම වන හෙයිනි.

සර්වාස්තිවාදීන්ගේ ප්‍රාතිමෝක්ෂයෙහි ශෛක්ෂ්‍ය ධර්ම යන නාමයෙන් හඳුන්වන ථෙරවාදීන්ගේ ප්‍රාතිමෝක්ෂයෙහිත් පාචිත්තිය පාළියෙන් ගෙන සාමණේර බණදහම් පොතටත් ඇතුළත් කර ඇති බව දක්නට ලැබෙන සෙඛියා පන්සැත්තෑව ක්‍රම කීපයකට කොටස් කර දැක්විය හැකිය. සාරූප්‍ය බව පිණිස පැණවූ දුක්කටාපත්ති ලේස යෙන් ශික්ෂා විසිහයක් ද භෝජන සංයුක්ත දුකුලාවන්ගේ ලේසයෙන් තිහක් ද, ආචාර ධර්ම පිණිස පැණවූ ශික්ෂා එකුන් විස්සක් ද වශයෙනුත්, තවත් අයුරකින් එය කොටස් කර බැලුවහොත් එම සෙඛියා අතර දත් වැළඳීම පිළිබඳව පණවා වදාළ ශික්ෂාපද තිහක් ද, ගමෙහිදී හැසිරිය යුතු පිළිවෙළ දක්වන ශික්ෂාපද දෙවිස්සක් ද ධර්ම දේශනා කිරීම පිළිබඳව දක්වන ශික්ෂා දහසයක් ද, මළමූත්‍ර කිරීම හා කෙළගැසීම සම්බන්ධයෙන් තුනක්ද භක්තාග්‍රයේ හැසිරිය යුතු, පිළිපැදිය යුතු අන්දම ගැන ශික්ෂා හතරක්ද ඇත්බව පෙනේ. යථෝක්ත විභජන ක්‍රමයන්ට අනුව ගතහොත් ආචාර ශික්ෂා පිළිබඳව දක්වන ලද ශික්ෂාපද සීමිත ප්‍රමාණයක් පමණක් ඇතිබව පෙනෙතත් මේ හැම එකක් ම සමස්තයක් වශයෙන් ගෙන බැලීමේ දී ඒ හැම එකකම සදාචාරාත්මක ලක්ෂණ දක්නට ඇතිබව මොනවට පැහැදිලි වෙයි.

සෙඛියාවන්හි හැඳීම, පෙරවීම, කෑම බීම - යාමඑම ගැන දැක්වූ ශික්ෂාපද සදාචාරය ඇතිකිරීමටත් වැදගත් ගුණධර්ම ඇතිකිරීමටත් බෙහෙවින් ඉවහල් වන බව කිවයුතුව ඇති අතර ඒවා ශිෂ්ට සම්පන්න සමාජයක තිබිය යුතු විශිෂ්ඨ ගුණාංග බව ද පැවසීමට පුළුවන.

අප කරන ක්‍රියාවල ශිෂ්ට අශිෂ්ට බව සුදුසු නුසුදුසු බව ගැළපෙන නොගැළපෙන බව හරි වැරදි බව තෝරා බේරා ගැනීමේදී අපට තරමක ගැටළුවකට මුහුණ පාන්නට සිදුවන බව පෙනේ. ඇතැම් සමාජයන් අතර, ඇතැම් පුද්ගලයන් අතර, ශිෂ්ටයයි සම්මත, ශිෂ්ටයයි ගණන්ගනු ලබන, ක්‍රියා, හැසිරීම්, පිළිවෙත් විධි, පිළිපැදීම් ක්‍රම, තවත් සමාජයක අශිෂ්ට විය හැකිය. බොහෝ විට කවරෙකුට වුවද පිළිකුල් හිතෙන, නුසුදුසුයැයි සිතෙන ගති පැවතුම් සිරිත් විරිත් ඇතැම් සමාජයක හිස්මුදුනෙන් පිළිගනිති නොකඩවා පවත්වා ගෙන යති. ඇත්තෙන් ම අශෝභන වුවද එම පැවතුම් තමන් කාලයක් තිස්සේ පාරම්පරික ව දිගින් දිගට පවත්වාගෙන එන නිසාම ඒවායේ ඇති අශෝභනත්වය ඔවුන්ට නොවැටහෙතැයි සිතිය හැක.

සෙඛියා ආදී ශික්ෂාපද බොහොමයක්ම පැණවීමෙහිලා ප්‍රබල ලෙස බලපෑවේයයි සිතිය හැකි බුධකාලීන බ්‍රාහ්මණ සමාජයේ පවා පැවති ඇතැම් අශෝභන සිරිත් විරිත් අගය කරන, ඒවා පාරම්පරිකව පවත්වා ගෙන එන, ඇතැම් උගත් බමුණු පිරිස් වර්තමානයේ පවා භාරත සමාජයේ ජීවත් වෙතැයි අසන්නට ලැබීම පූර්වෝක්ත කරුණ ස්ඵුට කරන සුළුය. කෑම කා අත ලෙවකෑම, කෑමේදී තලු ගැසීම, දියාරු දෙයක් "සුරුස්" යන අනුකරණයෙන් ඉහළට ඇද බීම අශීලාචාර අශෝභන හා බොහෝ දෙනා පිළිකුල් කරන පුරුද්දක් බව ඔවුන්ට නොවැටහෙනවා වන්නට පුළුවන. එසේ වුවද එම හැසිරීම් ක්‍රම බොහෝ දෙනෙකුට අප්‍රසන්න හැඟීම් ඇති කරන පිළිකුල් සහගත ක්‍රියාවන් බවනම් කිවයුතුය.

සෙඛියා ශික්ෂාපද කීපයක් වුවද පිරික්සා විමසා බැලීමෙන් ඒවා සදාචාරාත්මක හා පෞද්ගලික වශයෙන් මෙන් ම සාමාජික, සාමූහික වශයෙන් ද අනූන වැදගත් කමකින් යුක්ත බව පැහැදිලි වනු ඇත. මේවායේ ඇති වැදගත්කම, අගය තවදුරටත් වර්ධනය වන බව සඳහන් කළ හැක්කේ ඒවා සදාචාරාත්මක සාමාජික වශයෙන් පමණක් නොව සෞඛ්‍යසම්පන්න ජීවිතයක් ගතකරනු සඳහා ද මහත්සේ හේතු වන බව දකීමෙනි.

පරිමණ්ඩලං නිවාසෙස්සාමීති
සික්ඛාකරණීයා
පරිමණ්ඩලං පාරුපිස්සාමීති
සික්ඛාකරණීයා
සුපටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති
සික්ඛාකරණීයා
සුපටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සා-
මීති සික්ඛාකරණීයා
සුසංවුතො අන්තරඝරෙ ගමිස්සාමීති
සික්ඛාකරණීයා
සුසංවුතො අන්තරඝරෙ නිසීදිස්සාමීති
සික්ඛාකරණීයා

යථෝක්ත සෙඛියා ශික්ෂාපද වල සාමාන්‍ය අදහස ගතහොත් මෙසේ දැක්විය හැකිය. හඳින වස්ත්‍රය ඒ ඒ තැනින් කොන් එල්ලෙන පරිදි නො හැන්ද යුතුය. හොඳින් ඇඟ වැසෙන පරිදි හැඳ පෙරව මගට බැස්ස යුතුය. මහමග යනවිට සංවර සහිතව ගමන් කළ යුතුය. යම්තැනෙක හිඳගන්නා විට සංවර සහිතව සුදුසු පරිදි මනාව හිඳගත යුතුය. මෙවැනි සිකපදවල ඇති අගය වැඩිවන්නේ මේවා භික්ෂූන් වහන්සේලාට පණවන ලද ඒවා බව සලකා බැලීමේදී ය. භික්ෂූන් වහන්සේ නමකගේ ඉරියවු ගතිපැවතුම් කෙතරම් දුරට සකස් විය යුතුද මනාසංවරයෙන් යුතුව ශාන්ත දාන්ත විය යුතුද යනු මෙයින් මනාව පැහැදිලි වන අතර කෙනෙකුගේ යහපත් පැවැත්මට ඉතාසුළු හැසිරීම්වලින් පවා කෙතරම් සංවර වියයුතුද, යන බවත් වැටහේ. භික්ෂූන් වහන්සේ නමකගේ හැඳීම් පෙරවීම් පවා ක්‍රමානුකූල විය යුතුය. "යාව දෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටි

ඝාතාය ඩංසමකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය යාවදෙව හිරිකොපීන පටිච්ඡාදනත්ථං''යි දක්වූ භික්ෂුවකගේ සිවුරු පරිහරණය කිරීමේ මුඛ්‍ය පරමාර්ථවලට අනුවම ඒවා කළයුතු බව ද මින් කිය වෙයි. ''අප්පසන්නානං වා පසාදය පසන්නානං වා භියොභාවාය'' යනුවෙන් දක්වා ඇති පරිදි එපරිද්දෙන් මනාව තම සිවුරු පිළි හැඳීම පෙරවීම කරන උන්වහන්සේගේ එම කාර්යය දකින්නන්ගේත් අපැහැදුනවුන්ගේත් ප්‍රසාදය සඳහාත්, පැහැදුනවුන්ගේ අතිරේක ප්‍රසාදය සඳහාත් හේතු වෙයි.

ඇත්තවශයෙන් ම මේ ශික්ෂාපද භික්ෂූන් වහන්සේලා උදෙසා පණවන ලද ඒවා වුව ද සමාජයේ ජීවත්වන කවරෙකුට වුවද ගැළපෙන, පිළිපැදීමෙන් වැඩක් ම යහපතක් ම විනා අවැඩක්, අයහපතක් නො සිදුව කාගේත් සදචාරය දියුණු කර ගැනීමෙහි ලා ආදර්ශයට ගතයුතු ඉගැන්වීම් බව පැවසිය යුතුය. තම ඇඳුම ක්‍රමානුකූලව, ඇඳ පැළඳ ගැනීම ඒ පුද්ගලයාගේ ශිෂ්ටත්වය එක් අතකින් සංකේතවත් කරන සුළුය. ඇඳුමක් ක්‍රමානුකූලව ඇඳගත් පමණින් කෙනෙකු ශිෂ්ට සම්පන්නය යි කිව නොහැකි වුවත් ශිෂ්ට සම්පන්න ගති සිරිත් වලින් යුක්ත පුහුලා තම ඇඳුම වුවද ක්‍රමානුකූලව කරන බව කිවයුතුය. කෙතරම් උසස් තත්ත්වයක්, පදවි ඇති පුද්ගලයකු වුවද තම ඇඳුම පැළඳුම ඊට ගැළපෙන පරිදි නො කළොත් එය නුසුදුසු බව කාටත් පැහැදිලි කරුණකි. මනුෂ්‍ය සමාජයේ වසන ස්ත්‍රීපුරුෂ බාල මහලු කොයිකාටත් මේ ඉගැන්වීම්වලින් වටිනා ආදර්ශයක් ලැබේ. ශිෂ්ට සම්පන්න මිනිසකුගේ අවශ්‍යතා අතර වැදගත් එකක් වූ ඇඳුම් ඇඳීම එහි මුඛ්‍ය පරමාර්ථයන්ට අනුව කරන හැටි ඉගැන්වෙන හෙයිනි. ඇඳුම් ඇඳීම පිළිබඳව සංකීර්ණ විවිධ විපර්‍යාසවලින් යුක්ත වත්මන් සමාජයට වුවද මෙවායින් ගතහැකි ආදර්ශ බොහෝය.

පාරක ගමන් කරන විට සංවරව ගමන් කළ යුතුය. එසේ නැතිව වටපිට බලමින් කෑකෝ ගසමින්, අන්‍යයන් ගැන කිසිදු තැකීමක් නැතිව ගමන් කරමින් තම ගමනෙන් පවා අනුන්ට කරදරයක් හිරිහැරයක් ලෙස ජීවත්වන පුහුලෝ වත්මන් සමාජයේ වුවද බොහෝ සිටිති. රථවාහන මෙන්ම ජනාකීර්ණ මාර්ගවල යථෝක්තාකාරයෙන් ගමන් කරමින් විවිධ කරදර හිරිහැරවලට මුහුණ පා පරිහානිය කරා ගමන් ගන්නා පුද්ගලයෝ ද ඇත්තාහ.

''සුසංවුතො අන්තරඝරෙගමිස්සාමීති'' සික්ඛාකරණීයා යන මෙයින් කියැවෙන්නේ ඇතුලු ගම්හි භික්ෂුවක් ගමන් කළයුතු ආකාරය යි. කොතැනක වුවත් භික්ෂූන් වහන්සේ නමක් ගමන් කළ යුතු සංවර ස්වභාවය මින් දක්වා ඇත. පැවිදි පක්ෂයට මේ කරුණ විශේෂයෙන් වැදගත්වන අතර ගිහිපක්ෂයේ කවරෙකුට වුවද වැදගත් දෙයක් වන බව අමුතුවෙන් කිවයුතු නොවේ. චණ්ඩාශෝක රජු ධර්මාශෝක බවට පත්වූයේ සුසංවුතව ගමන් කළ සත්හැවිරි නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ දර්ශනය මූලික කරගෙන බව ප්‍රසිද්ධ කරුණකි. සම්මා සම්බුද්ධ ශාසනය වෙනුවෙන් අති විශාල මහඟු සේවයක් ඉටුකරමින් ආගමික ලෝකයේ ප්‍රබල විපර්‍යාසයක් කළ ධර්මාශෝක නිරිඳුන් බුදුසසුන කෙරෙහි පැහැදීමට මුල්වූයේ උන්වහන්සේගේ සංවරශීලී පැවැත්මයි. සෙඛියා වැනි ධර්මවලින් බිහි කිරීමට බලාපොරොත්තු වන එවැනි සංවර ශීලී භික්ෂුවක් ධර්මදේශනා නො කිරීමෙන් රටට, සමාජයට කිසිදු අයහපතක්, හානියක් සිදු නො වේ. උන්වහන්සේගේ එම සංවරශීලී පැවැත්මම රටට ධර්මදේශනයකි. මහඟු ආදර්ශයකි, එය දම්සෝ පුවතින් වුවද මොනවට පැහැදිලි වෙයි.

යම් තැනක වාඩිවීමේ දී කිසිම සැළකිල්ලක් සුදනමක් නැතිව වාඩිවන බොහෝ දෙනෙක් සමාජයේ සිටිති. ඇතැම් විට විශාල පිරිස් මැද අපරහරව හැසිරෙන ඔවුන් අනුන්ගේ සිනාවට ලක්වන, ලජ්ජාවට පත්වන, අවස්ථා විරල නො වේ. එබඳු සමාජයක යහපත් ආචාර ධර්ම ඇති කරනු සඳහා සෙඛියාවල එන මෙබඳු ඉගැන්වීම් වලින් ලැබෙන පිටුබලය අසීමිතය.

සිනාසීම කථා කිරීම නොගැළපෙන තාලයට, අනුන්ට කරදර වන ලෙස, මහත් හඬින් නො කළ යුතු යයි කියැවෙන,

"න උජ්ඣග්ගිකාය අන්තරඝරෙ-නිසීදිස්සාමි-ගමිස්සාමීති සික්ඛාකරණීයා"
"අප්පසද්දෙ අන්තරඝරෙ-නිසීදිස්සාමීති-ගමිස්සාමීති-සික්ඛාකරණීයා"

යන සිකපදවලින් දක්වා ඇත. මහත් හඬින් නොගැළපෙන ලෙස සිනාසීම සදචාර සම්පන්න පුද්ගලයෙකුගේ ස්වභාවය නොවේ. පැවිදි සමාජයට පමණක් නොව ගිහි සමාජයට වුවද මේ ඉගැන්වීම සාධාරණය. කාව්‍යශේඛරයේ දී රහල් හිමිපාණන් වහන්සේ "සිනානොමසෙන් දසන් දක්වා" යනුවෙන් දක්වා ඇත්තේ මහ හඬින් නොව දත් පෙනෙන්නට වුවද සිනාසීම යහපත් ස්ත්‍රියකට පවා නුසුදුසු හෙයිනි. මහ හඬින් කථා කරමින් කෑකෝ ගසමින් නොව අල්ප ශබ්ද ඇතිව යම් තැනක සිටිය යුතු බවත් ගමන් කිරීමේදීත් එලෙස හැසිරිය යුතු බවත් කියැවෙයි. "මිතභාණිනම්පි නින්දන්ති" යන ප්‍රකාශනයට අනුව ප්‍රමාණයකට කථා බස් කරන අයට වුවද නින්ද කරන, දෙස් පවරන ලෝකයේ එපරිද්දෙන් කෑකෝ ගසමින් හැසිරෙන අයට කුමක් නොකියන්නේ ද කුමන නින්ද අපහාසවලට ලක් වන්නට සිදුවන්නේ දැයි සිතා බැලිය යුතුය. බෞද්ධ සාහිත්‍යයේ සඳහන් පරිදි එදා ජීවකම්බවනයේ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ ඇතුලු අඩතෙළෙස් යල් සියයක් සඟුන් වසන විශාල පිරිස අතරෙන් කිවිස්නා හඬකුදු නොනැගුණු ආකාරය පසුව අජාසත් රජතුමාගේ පැහැදීමටත් ප්‍රශංසාවටත් ලක් වූ අයුරු පෙනේ. යම් ස්ථානයක නිතරම කෑකෝ ගසමින් වසන පිරිසක් වෙයි නම් ඔවුන්ගෙන් අන්‍යයන්ට සිදුවන කරදර අප්‍රමාණය. යම් තැනක ශාන්ත බව රැකීමට පමණක් නොව එහි වසන්නන්ගේ ශිෂ්ටත්වය දැනගැනීමට ද එහි පවතින නිශ්ශබ්දතාව බොහෝ විට හේතුවෙයි.

කය සලසලා (කායප්පචාලකං) අත සල සලා (බාහුප්පචාලකං) හිස සල සලා (සීසප්පචාලකං) උකුලෙහි තබන ලද අත් ඇතිව (ඛම්භකතො) ගමනා ගමන නො කළ යුතු යයි කියැවෙන සික පදවල ද ඇත්තේ ආචාරධර්මාන්විත ස්වභාවයකි. න සුරු සුරු කාරකං භුඤ්ජිස්සාමි (සුරු සුරු යන හඬ ඇති කොට නුබුදින්නෙමි). න හත්ථ නිල්ලෙහකං භුඤ්ජිස්සාමි (අත ලෙව ලෙවා නොකන්නෙමි) න පත්තනිල්ලෙහකං භුඤ්ජිස්සාමි (පාත්‍රය ඇඟිල්ලෙන් ලෙව කමින් නුබුදින්නෙමි) න ඔට්ඨ නිල්ලෙහකං භුඤ්ජිස්සාමි (දිවෙන් පිටිතොල් ලෙව ලෙවා නුබුදින්නෙමි) න චපු චපු කාරකං භුඤ්ජිස්සාමි (චපු චපු යන අනුකරණයෙන් නුබුදින්නෙමි. න භුඤ්ජමානො සබ්බං හත්ථං මුඛෙ පක්ඛිපිස්සාමි (වළඳමින් සම්පූර්ණ අත මුඛය තුළ බහා නොලන්නෙමි) න සකබළෙන මුඛෙන බ්‍යාහරිස්සාමි (ආහාර කටේ ඇතිව කථා නො කරන්නෙමි) න පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජිස්සාමි (බත් පිඩු කටට වීසි කරමින් නුබුදින්නෙමි.)

මෙහි සඳහන් වූයේ සදචාරාත්මක අගයෙන් යුතු තවත් සෙඛියාධර්ම කීපයකි. කෑම කන විට දී චපු චපු, සුරු සුරු වැනි අශෝභන ශබ්ද පවත්වමින් තලු ගසමින් කන පුද්ගලයෝ කවදත් සමාජයේ සිටිති. භික්ෂු සමාජයේ ද මෙවැනි අඩුපාඩු දුර්වල කම් ඇති අය වාසය කරන බව මෙහිදී කිව යුතුව ඇත. කෑම කා අත ලෙව කෑම, කෑම කන භාජනය ලෙව කෑම, පිටිතොල් ලෙව

මින් අනුභව කිරීම, කෑම ගැනීමේ දී සම්පූර්ණ අත මුඛය තුළට දැමීම වැනි ක්‍රියා දකින කාටත් පිළිකුල උපදවන සිරිත්ය. ශිෂ්ට සම්පන්න කිසිවෙකු විසින් එවැනි ක්‍රියා පිළිකුලට භාජනය කරනු මිස කිසිදක ප්‍රශංසාවට ලක් නොකරනු ඇත. එවැනි සිරිත් ඇති කර ගත් අයට පිරිස් මැදදී පවා අන්‍යයන්ගේ සිනහවට, උපහාසයට ලක් වන්ට සිදුවෙයි. එපමණක්ද නොව මෙවැනි ගති පැවතුම් පුරුදු වූ අය නිසා අන්‍යයන්ට සිදුවන කරදර ද බොහෝය. යථෝක්තාකාර යෙන් අහර අනුභව කරන පුහුලන් දකින සෙස්සන්ට ඇතිවන පිළිකුල නිසා සමහර විට ඔවුන්ට කුසගින්නෙන් පවා සිටීමට සිදුවන අවස්ථා එමටය.

බොහෝ දෙනෙක් අහර මුඛයේ තිබෙද්දී කථා කරති. එය නොකළ යුතු යයි සෙඛියාවලින් කියා ඇත. එහි ඇති අශෝභන මෙන් ම පිළිකුල් සහගත බවත් වැට හෙන්නේ බලා ගෙන සිටිනවුන්ට පමණි. අඩක් හපන ලද අහර කැබලි මුඛයේ ඇති විට කථා කිරීමේ දී එම අහර කැබලි අන් අයට පෙනේ. කෑමට පෙර කෙසේ තිබුණත් ඒවා තරමක් හපා අන්‍යයෙකුගේ කටේ තිබෙද්දී දකින විට ඇතිවන පිළිකුල දන්නෝ දනිති.

අහර මුඛයට ළං කරන්නට පළමුව මුඛය විවෘත නොකළ යුතු බව, අනුභව කරද්දී අත ගසා නො දැමිය යුතු බව දිව බොහෝ සෙයින් දික්කර අහර නොගත යුතු බව ද කියවෙන සෙඛියාධර්ම ඇත. යමෙක් අහර කටේ තබාගෙන කථා කරන් නට සිනාසෙන්නට ගියහොත් නොයෙක් අපහසුතාවන්ට පවා පත් වන්නට ඔහුට සිදුවන බවද පෙනේ.

කෑම ගැනීමේ දී එය ක්‍රමානුකූලව, පිළිවෙලකට, බත්හුළු ආදිය බිම නො වැටෙන ලෙස කළ යුතු බව දක්වා ඇත. අහර අනුභව කරද්දී අනෙකාගේ අහර බඳුන දෙස ගිජුකමින් හා කිපුණු සිතින් නො බැලිය යුතු බව පවසන ''න උජ්ඣාන-සඤ්ඤී පරෙසං පත්තං ඔලොකෙස්ස මී'' ති යන ඉගැන්වීම යහපත් ආචාර ධර්මයකට මඟ කියා දෙන්නකි.

'න සාමිසෙන හත්ථෙන පානියථාලකං
පටිග්ගහෙස්සාමී
න සසිත්ථකං පත්ත ධොවනං
අන්තරඝරෙ හරිස්සාමී'

යනුවෙන් ඉඳුල් සහිත වූ අතින් පැන් භාජන ආදියක් නො පිළිගන්නට නො අල්වන්න ටත් කෑම ගත් භාජනය සේදූ විට ජලයේ බත්හුළු ආදියක් තිබේ නම් එම ජලය සුදුසු තැනකට දැමිය යුතු බව දක්වා ඇත. ඉඳුල් සහිත වූ අතින් භාජන ඇල්ලීම කෙතරම් අශෝභන, එමෙන් ම සෞඛ්‍යයට පවා කෙතරම් අහිතකර ද යනු පැහැදිලි කරුණකි. ගෙයක් ඉදිරිපස බත්හුළු විසිරී තිබීම එහි අවලක්ෂණයට හා අපිරිසිදුතාවට හේතු වෙයි. දකින්නන්ට අප්‍රිය ද උපදවන සුළුය. ඒ හැර ඒවා එක් තැනකට දැමීම කුඩා සතුන්ගේ ප්‍රයෝජනය සඳහා ද හේතු වෙයි. එබඳු මහඟු ප්‍රයෝජන රාශියක් මෙවැනි ඉගැන්වීම්වලින් සිදුවන බව කිව යුතුය. භාජන සේදූ වතුර ගෙහි ඉදිරිපස දැමීම වැනි කරුණු නුසුදුසු බව නොසලකන, නොදන්නා ගෘහණියන්ට මෙබඳු සදාචාරාත්මක ඉගැන්වීම් වලින් ගත යුතු පාඩම් බොහෝ වෙති.

ධර්මදේශනා කිරීම පිළිබඳව ඇති ශික්ෂාපද වුවද ධර්ම ගෞරවය රැකෙන ආකාරයට සිද්ධ කළ යුතු අයුරු දක්වා ඇත. සම්බුදු දහම වැනි ශ්‍රේෂ්ඨ දහමක් දේශනා කළ යුත්තේ ඇසිය යුත්තේ එහි ගෞරවාන්විත බවට හානි නොවන ලෙස ය. නොගිලන්ව පාවහන් පය ලාගෙන, හිස්වැසුම් පැළඳ ගෙන උසසුන්වල සිටින ආයුධ ගත් අත් ඇති පුද්ගලයන්ට ධර්ම දේශනා නො කළ යුතු බව පෙන්වා ඇත. දේශකයන් වහන්සේ ද තමන්ට සුදුසු අසුනක, ස්ථානයක වැඩ සිටිය යුතු ය.

යම් කිසි වැඩිහිටියෙක්, වැදගත් කෙනෙක් යහපත් අවවාදයක් අනුශාසනාවක් කරන විට කිසිම ගෞරවයක් නැතිව, ගණන් නොගෙන සිටීම එම අනුශාසනාව කරන තැනැත්තාගේ වුවද හිත රිදීමට හේතුවෙයි. නියම ආචාර සම්පන්න ගතිය නම් කරන අවවාදය ගෞරවයෙන් පිළිගැනීම බව මින් කියවෙයි. ''න සූපං වා ඔදනං වා අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'' යන්නෙන් කරන ඉගැන්වීම ද භික්ෂූන් වහන්සේලාට පමණක් නොව සකල ගිහි ජනතාවට ද ප්‍රයෝජනවත් වෙයි. අසනීපාදී කරදරයක් නැතිව නිතරම ආහාර ආදී නොයෙක් දේ තමන් සඳහා නොඉල්විය යුතුබව මෙයින් පැවැසේ. යමෙක් එලෙස ඉල්ලන්නට පටන් ගත හොත් ඔහු අන්‍යයන්ට - පිළිකුල් වෙන කෙනෙකු බවට පත්ව තමන් අනුන්ට මහත් කරදරයක් හිසරදයක් බවට ද පත් වෙයි.

මළ මූත්‍ර කිරීම, කෙළ ගැසීම වුවද මහජනයා ගැවසෙන තැන්වල, එමෙන්ම කාටත් නිරන්තරයෙන් ප්‍රයෝජන ඇති ජලය ඇති තැන්වල නොකළ යුතු බවත් එවැනි දේ කිසි කෙනෙකුට අවහිරයක් නොවන ලෙස ශිෂ්ට සම්පන්නව කළ යුතු බවත් පෙන්වා දී ඇත. ''මනං උස්සන්නත්තා මනුස්සා'' යි මනස, සිතුවිලි උසස් නිසා ''මිනිස්'' නම ලබන ශිෂ්ට සම්පන්න පුද්ගලයාගේ ගමන බිමන ආදී හැම කටයුත්තක් ම තමන්ටත්, අනුන්ටත් කරදරයක් සිදු නොවන ලෙස විය යුතුය. එලෙස අත්තව්‍යාබාධාය (තමන්ට කරදර පිණිස) පරව්‍යාබාධාය. (අනුන්ට කරදර පිණිස) උභයව්‍යාබාධාය (දෙපාර්ශ්වයටම කරදර පිණිස) හේතුවන ක්‍රියා කලාප රාශියක් දුරු කරගෙන සදචාර සම්පන්න සමාජයක් බිහිවීමට ඉවහල් වන ඉගැන්වීම් රාශියක් සෙඛියාවන්හී ඇතුළත් බව මෙ අනුව පැහැදිලි වන අතර සෙඛියාවල එන ඉගැන්වීම් වලට අනුව යම් සමාජයක් හැඩ ගැසේ නම් එය ශිෂ්ට සම්පන්න සමාජයන් අතර විශිෂ්ඨස්ථානයක් ම ලබන බව ද සඳහන් කළ හැකිය.

පරිශීලනය කළ ග්‍රන්ථ.

1. ප්‍රාතිමෝක්ෂය.
2. බුද්ධධර්මය හා බෞද්ධ සභ්‍යත්වය - පූජ්‍ය පණ්ඩිත හේ. ඤාණසීහ හිමි.
3. අනගාරික ප්‍රතිපදාව - පූජ්‍ය මා. සොමිස්සර හිමි.
4. බුද්ධ ධර්මය හා සංස්කෘතිය - පූජ්‍ය අ. රාහුල හිමි.